# කම්කරු අමාත්‍යාංශය

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

NIOSH
National Institute of Occupational Safety and Health • Sri Lanka

## තනතුරු පුරප්පාඩු

කම්කරු අමාත්‍යාංශයට අනුබද්ධිත හා 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත යටතේ ස්ථාපිත ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) : තනතුරු 04

### 1.1 පත්වීමේ ස්වභාවය

| | | | |
|---|---|---|---|
| i. | සේවා ගණය | : | **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)** |
| ii. | වැටුප් කේතය | : | MA 1 -1-2025 III ශ්‍රේණිය |
| iii. | වැටුප් පරිමාණය | : | රු.46,220-10X 540-7X 630–4X 890- 20X 1190 - 83,390 |

### 1.2 බඳවා ගැනීමේ සුදුසුකම් :

### 1.2.1 අධ්‍යාපන

: **බාහිර අයදුම්කරුවන් සඳහා**

***අධ්‍යාපන සුදුසුකම්***

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල / දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් ඇතුළුව විෂයයන් 04කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් සමත්ව තිබීම.

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයන් 03 ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

***අධ්‍යාපන සුදුසුකම්***

- ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය සේවා ගණයන්හි පහත සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

i. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල / දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව යන විෂයයන්

ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් සමත්ව තිබීම.

ii. සේවයේ ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

iii. නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**1.2.3 වයස** : ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**1.2.4. වෙනත්** : සෑම ඉල්ලුම්කරුවෙක්ම,

I. ශ්‍රී ලාංකීක පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරිම සඳහා මනා යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**1.3 බඳවා ගැනීමේ ක්‍රමවේදය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගනු ලැබේ.

**සේවා නියුක්ත කරවීමේ කොන්දේසි**

මෙම පත්වීම් ස්ථිරය .සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

**බඳවා ගැනීමේ දි වැටුප**

බාහිර අයදුම්කරුවන් අතුරින් බඳවා ගැනීමේ දි අදාල තැනැත්තා වැටුප් පරිමාණයේ ආරම්භක පියවරෙහි පිහිටුවනු ලැබේ. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේ දි පිහිටුවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

**අයදුම් කිරීමේ ක්‍රමය**

ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත **2025/08/15** දිනට හෝ ඊට පෙර **අධ්‍යක්ෂ ජනරාල්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, අංක 97, ජාවත්ත පාර , කොළඹ 05** ලිපිනයට ලියාපදිංචි තැපැල මඟින් යොමු කල යුතුය. තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේ නම් එක තනතුරකට එක බැගින් වන සේ අයදුම්පත්‍ර වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතුය**.**

අයදුම්පත බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාල තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසු ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය**

තනතුරට පත් කිරිම සඳහා ඉල්ලුම් කිරිම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2025/08/15** දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණි.

මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සම්බන්ධයෙන් අවසාන තීරණය ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ පාලක මණ්ඩලය සතු වේ.


දුරකථන අංකය :- 011- 2585425 / 011 – 598672
විද්‍යුත් තැපැල :- info@niosh.gov.lk
වෙබ් අඩවිය :- www.niosh.gov.lk

ලිපිනය :- **අධ්‍යක්ෂ ජනරාල්**
ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය
අංක 97
ජාවත්ත පාර
කොළඹ 05